# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2280/28 - 2022 මැයි මස 18 වැනි බදාදා - 2022.05.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා විසින් ඌව පළාත් සභාවේ 2000 අංක 05 දරන ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ 6අ(I) වගන්තිය අනුව, පහත සඳහන් පත්කිරීම් සිදුකර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *නම හා ලිපිනය* | *තනතුර* | *කාලසීමාව* |
|---|---|---|
| (1) ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය,<br>ලේකම්,<br>ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන,<br>නීතිය හා සාමය, අධ්‍යාපන, ඉඩම්, පළාත් පාලන,<br>විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල<br>පහසුකම් සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය,<br>ඌව පළාත් සභාව,<br>බදුල්ල. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *නම හා ලිපිනය* | *තනතුර* | *කාලසීමාව* |
|---|---|---|
| (2) නිහාල් ගුණරත්න මහතා,<br>ලේකම්,<br>ඌව පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික හා පේෂකර්ම හා කුඩා කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශය,<br>ඌව පළාත් සභාව,<br>බදුල්ල. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |
| (3) එම්. ඊ. සුමිත්‍රා සිල්වා මහත්මිය,<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය),<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය,<br>කළමනාකරණ දෙපාර්තමේන්තුව.<br>ඌව පළාත් සභාව,<br>බදුල්ල. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |
| (4) එම්. එම්. විජේනායක මහතා,<br>පළාත් පාලන කොමසාරිස් (ඌව),<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව,<br>මාටින් සිල්වා මාවත,<br>බදුල්ල. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |
| (5) ඩී. එම්. රත්නායක මහතා,<br>ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>බදුල්ල. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |
| (6) ආචාර්ය කේ. එම්. ආර්. කේ. කුලතුංග මෙනවිය,<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,<br>ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,<br>බදුල්ල. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |
| (7) ඩබ්. සුනිල් මහතා,<br>අධ්‍යක්ෂ ජනරාල්,<br>ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,<br>අංක 14, නිදහස් මාවත,<br>කොළඹ 07. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |
| (8) විජය ප්‍රේමදර්ශන මහතා,<br>සහකාර අධ්‍යක්ෂ,<br>ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,<br>අංක 14, නිදහස් මාවත,<br>කොළඹ 07. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික | 2022.03.15 වැනි දින සිට වසර 02ක කාලයක් සඳහා |

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2022 අප්‍රේල් මස 26 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 05 - 0086/1

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ගාමිණි මහින්දපාල ජෝපියස් මහතා, 2021.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වශයෙන්.

02. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරී වෛද්‍ය ඒ. එම්. ටී. කේ. අත්තනායක මහතා, 2022.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වසරක කාල පරිච්ඡේදයක් සඳහා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

03. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඉංජි. කේ. ඒ. බී. සෙනෙවිරත්න මහතා, 2021.01.17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වශයෙන්.

04. ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය පී. ජී. ඩී. එස්. ප්‍රේමතිලක මහත්මිය අසනීප වී ප්‍රතිකාර ලබා ගන්නා බැවින්, 2022.01.31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇය නැවත සේවයට පැමිණෙන තෙක්, සහකාර ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය එම්. පී. එස්. කරුනාරත්න මහත්මිය, ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

05. ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ ඉංජි. එම්. ටී. ජී. ඒ. එන්. ලක්මාල් මහතා, අසනීප වී ප්‍රතිකාර ලබා ගන්නා බැවින්, 2022.02.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු නැවත සේවයට පැමිණෙන තෙක්, යාන්ත්‍රික ඉංජිනේරු ඉංජි. ආර්. එම්. ඊ. ලක්මාල් මහතා, ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට.

06. බණ්ඩාරවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් ටී. ගජේන්ද්‍රන් කුමාර් මහතා 2022.02.28 වැනි දින සිට 2022.06.02 වැනි දින දක්වා විදේශගත වන බැවින්, 2022.02.28 වැනි දින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරී, ඩබ්. එම්. පී. පී. කුමාර මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට හා වැඩ බැලීමේ රාජකාරීවලට අමතරව, බණ්ඩාරවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරී ඉටු කිරීමට.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2022 අප්‍රේල් මස 26 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 05 - 0086/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.